**නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**--------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 12 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර, පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 16 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගණකාධිකරණ අඩුපාඩු
--------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් පොත අනුව සභාවේ බැංකු ගිණුම් දෙකෙහි 2016 දෙසැම්බර් 31 දිනට අනුව ශේෂය පිළිවෙලින් රු.292,474 ක් හා රු.428,690 ක් විය. එනමුත් මූල්‍ය ප්‍රකාශනවල එකී ශේෂයන් පිළිවෙලින් රු.608,630 ක් සහ රු.400,183 ක් වශයෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකු ශේෂය රු.287,649 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සේවක ණය ලේඛනයට අනුව, සේවක ණය ශේෂ රු.11,151,630 ක් විය. එනමුත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.13,028,854 ක් විම නිසා සේවක ණය රු.1,877,224 ක් වැඩියෙන් දක්වා තිබුණි

(ඇ) වර්ෂ 1999 සිට 2014 දක්වා කාලය තුළ ආයතන 42 කට ප්‍රදානය කරන ලද එකතුව රු.2,131,856 ක්වූ අත්තිකාරම් අයකර තිබුණි. එනමුත්, එය තවදුරටත් ලැබිය යුතු අත්තිකාරකම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර තිබුණි.

(ඈ) සභාව විසින් පවත්වා තිබූ තක්සේරු බදු ලේඛනයට අනුව අයකළ තක්සේරු බද්ද රු.26,391,169 ක් විය. එනමුත්, එය රු.25,811,127ක් වශයෙන් ආදායම් ප්‍රකාශනයෙහි දැක්වීම නිසා ආදායම් රු.580,042 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී මිලට ගත් විදුලි උත්පාදනයේ පරිව්‍යය වශයෙන් රු. 2,346,00 ක් ගිණුම්ගත කර තිබුණි. එනමුත් විදුලි උත්පාදනය මිලට ගෙන නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

රු.15,182,911 ක් වූ ලැබිය යුතු වරිපනම් හා බදු පිළිබඳ කාල විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.3.3 නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර දෙකකට පෙර ජනතාවගෙන් ජල සැපයුම සඳහා ලබාගත් රු.335,750ක්වූ කල් ඉකුත් තැන්පතු පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය x වගන්තිය - 193 | වර්ෂයේ තත්‍ය ආදායම හා වියදම අයවැයගත ඇස්තමේන්තු සමඟ සසඳමින් විචලන ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. එනමුත් එසේ කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ කටයුතු වලින් පුනරාවර්ථන වියදම ඉක්මවූ රු.60,326,840 ක්වූ අතිරික්තයක් උද්ගත වූ අතර, ඉකුත් වර්ෂය සමඟ සැසඳූ විට ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.36,061,611 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

(අ) සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම,තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම | තත්‍ය ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 24,918 | 25,811 | 15,182 |
| බදු කුලී | 2,188 | 4,067 | 752 |
| බලපත්‍ර ගාස්තු | 2,072 | 541,094 | 94 |
| අනෙකුත් ආදායම් | 5,803 | 4,692 | 1,523 |

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව, සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංචාරක අමුත්තන් සඳහා වූ නිවාසවල ආදායමින් 1% ක් ගාස්තු වශයෙන් අය කළ යුතු වේ. එනමුත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංචාරක අමුත්තන් සඳහා වූ නිවාස 06 ක් අතුරෙන් නිවාස 02කින් එවැනි ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) උප්පුවේලි වෙළඳපොළ අමුත්තන් සඳහා වූ නිවාස, ගොඩනැගිලි සහ කඩ කාමර කුලී වශයෙන් ලැබිය යුතු රු.237,169 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව, 2018 සිට 2016 දක්වා කාල පරිච්ඡේදයසඳහා ඉඩම්, ගොඩනැගිලි සහ ඉදිකිරීම් වලින් වරිපනම් හා බදු වශයෙන් අයකළ යුතු රු.15,182,917 ක් වූ මුදල් ප්‍රමාණයක් අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙනත් ආයතන වලින් පරිත්‍යාග වශයෙන් සභාවට ලබාගත් වාහන අටක් වසර 11 ක් පුරා අයිතිය පවරා ගැනීමෙන් තොරව දිගින් දිගටම පැවතුණි.

(ආ) 2005 වර්ෂයට පෙර පොත් 2563 ක් පුස්තකාලය විසින් නිකුත්කර තිබුණි. මෙම පොත් මෙතෙක් ආපසු භාරදී නොතිබුණි.

(ඇ) රු.34,500 ක්වූ සභාවේ සේවකයන් 03 කට ප්‍රදානය කරන ලද හිඟ ණය ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.2 අනාර්ථික ගනුදෙනු

----------------------

1980 අංක 46 දරන සේවක අරමුදල් පනත ප්‍රකාරව සේවක අරමුදල් සඳහා වූ දායක මුදල් අදාළ මාසය අවසානයට පෙර ප්‍රේෂණය කළ යුතු වේ. එනමුත් සභා සේවකයන් දෙදෙනෙකුගේ 2014 මැයි සිට සැප්තැම්බර් කාල පරිච්ඡේදයට වගකිවයුතු නිලධාරීන් විසින් නියමිත අවස්ථාවලදී ප්‍රේෂණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.17,079 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

4. කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

වඩාලිපිල්ලෙයාර් කෝවිල පාර පළාත් පාලන ආයතන පසුගාමී ප්‍රදේශ සංවර්ධනය සඳහා වූ ප්‍රතිපාදන යටතේ රු.799,860 ක පිරිවැයකින් පිළිසකර කිරීම සඳහා 2016 දෙසැම්බර් මසදී සභාව විසින් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම කාර්යය සඳහා අවශ්‍ය තාර බැරල් ප්‍රවාහන ගාස්තුව රු.1,000 ක් ඇතුළුව බැරලයක් රු.9,900 බැගින් පිරිවැය එකතුව රු.10,900 බැගින් ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් මිලට ගත හැකිව තිබුණි. එනමුත් බැරලයකට රු.13,000 බැගින් අමතරව රු.58,000ක වැයක් සිදු කරමින් පෞද්ගලික ආයතනයකින් බැරල් 28 ක් මිලට ගෙන තිබුණි. පෞද්ගලික ආයතන විසින් සපයන ලද තාරවල තත්ත්වය පිළිබඳව තහවුරු කර නොතිබුණි.

(ආ) වැඩ ඇස්තමේන්තුව අනුව මෙම කාර්යය සඳහා අවශ්‍ය ද්‍රව තාර ලීටර් ප්‍රමාණය ලීටර් 4356 ක් විය. එ නමුත් තාර ලීටර් 5040 ක්( බැරල් 28ක්) මිලට ගෙන තිබුණි. අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් මිලට ගත් තාර ලීටර් 684 ක් ගබඩාවේ තිබූ බැව් 2017 ජූනි 21 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී හෙළි විය.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලන

-------------------------------------

නිෂ්ක්‍රීය වත්කම්

--------------------

2014 පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද කඩ කාමර 16 න් කාමර 8ක් 2014 වර්ෂයේ පටන් නිෂ්ක්‍රීයව තිබුණි.

6. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවශ්‍ය අවධානය |
|---|---|---|
| | ------------------- | ----------------- |
| (අ) | ගිණුම්කරණය | ලෙජර විධිමත්ව යාවත්කාලීනව පවත්වා ගැනීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් රැස්කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. |